සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ........................................................................................ විභාග අංකය :- ...........................

## I කොටස

**සැලකිය යුතුයි:**

* I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

* අංක 1 -20 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) ලෝකයේ පැරණිම ගොවිතැන් ක්‍රමය ලෙස සැලකෙන්නේ,
(1) වී ගොවිතැනයි (2) හේන් ගොවිතැනයි
(3) කෝපි වගාවයි (4) රබර් වගාවයි

(02) සකපෝරුව භාවිතා කරන්නේ මින් කුමන කර්මාන්තය සඳහාද?
(1) මැටි කර්මාන්තය (2) කපු කර්මාන්තය
(3) යකඩ කර්මාන්තය (4) උක් කර්මාන්තය

(03) වෙළඳපොළක පාලනය සම්බන්ධව නීති ඇතුළත් සෙල්ලිපිය මින් කුමක්ද?
(1) තෝනිගල සෙල්ලිපිය (2) අඹගමුව සෙල්ලිපිය
(3) බදුලු ටැම් ලිපිය (4) ගල්පොත සෙල්ලිපිය

(04) මානවම්ම රජතුමාගේ චරිතයෙන් ඔබට ගතහැකි ඉතා වටිනා ආදර්ශය කුමක්ද?
(1) අධිෂ්ඨානශීලීව හා ඉවසිලිවන්තව කටයුතු කිරීම
(2) සටන් කරමින් සතුරන් පරාජය කිරීම
(3) විදේශ රටවලින් ආධාර උපකාර ලබාගැනීම
(4) සැලසුම් සහගතව කටයුතු කිරීම

(05) සහෝදරයාගෙන් සහෝදරයාට රජකම උරුමවීමේ සම්ප්‍රදාය අනුව රාජ්‍යත්වයට පත් රජවරු ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) පණ්ඩුකාභය රජුගෙන් පසු මුටසීව රජුට
(2) දෙවන දප්පුල රජුගෙන් පසු නවවන අග්ගබෝධි රජුට
(3) වසභ රජුගෙන් පසු වංකනාසිකතිස්ස රජුට
(4) දුටුගැමුණු රජුගෙන් පසු සද්ධාතිස්ස රජුට

(06) සංගමුවිහාර සෙල්ලිපිය හා සම්බන්ධ පාලකයින් දෙදෙනාගේ නම් සඳහන් පිළිතුර තෝරන්න.
(1) පස්වන මිහිඳු රජු හා පළමුවන රාජේන්ද්‍ර චෝළ රජු
(2) පළමුවන විජයබාහු රජු හා කේශධාතු කාශ්‍යප
(3) පරාක්‍රමබාහු කුමරා හා දෙවන ගජබාහු
(4) පරාක්‍රමබාහු කුමරා හා මානාභරණ කුමරු

(07) පහත සඳහන් ගොඩනැගිලි අතුරින් නිශ්ශංකමල්ල රජතුමා විසින් ඉදි කරවන ලද ගොඩනැගිල්ල වන්නේ,
(1) දැදිගම කොටවෙහෙර යි. (2) පොළොන්නරුවේ ගල්විහාරය යි.
(3) පොළොන්නරුවේ කිරිවෙහෙර යි. (4) පොළොන්නරුවේ රන්කොත්වෙහෙර යි.

(08) යුනෙස්කෝ සංවිධානය විසින් ශ්‍රී ලංකාවේ ලෝක සංස්කෘතික උරුම ලෙස පිළිගෙන තිබෙන ස්ථාන සංඛ්‍යාව වන්නේ,
(1) 6 කි (2) 20 කි (3) 84 කි (4) 704 කි

(09) ලෝක උරුමයක් ලෙස නම්කර ඇති මොහෙන්ජොදාරෝ නගරය පිහිටා ඇත්තේ,
(1) චීනයේ ය. (2) පාකිස්ථානයේ ය. (3) ඉන්දියාවේ ය. (4) ඇෆ්ගනිස්ථානයේ ය

(10) අම්බලන්ගොඩ හා උඩුපිල වැනි ප්‍රදේශ වඩාත් ප්‍රසිද්ධියක් උසුලන්නේ පහත සඳහන් කවර කලාශිල්ප සඳහාද?
(1) වෙස්මුහුණු (2) ලාක්ෂා (3) පැදුරු විවීම (4) පිත්තල කැටයම්

(11) දකුණු ඉන්දියාවේ මුල් වරට විශාල අධිරාජ්‍ය බලයක් ගොඩනැගුවේ,
(1) චෝලයන් ය. (2) පල්ලවයන් ය. (3) පාණ්ඩ්‍යයන් ය. (4) කාලිංගයන් ය.

(12) ★ කව් සිළුමිණ රචනා කිරීම
★ කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන උපාධි නාමයෙන් පිදුම් ලැබීම
ඉහත ඓතිහාසික සිද්ධි හා සම්බන්ධ රජතුමා වන්නේ,
(1) පළමුවන විජයබාහු ය. (2) තුන්වන විජයබාහු ය.
(3) දෙවන පරාක්‍රමබාහු ය. (4) හයවන පරාක්‍රමබාහු ය.

(13) යාපහුව රාජධානි සමයේ වෙළෙඳ සබඳතා පවත්වා ගැනීමේ අරමුණින් මිසරයේ කයිරෝ නගරයට දූත පිරිසක් පිටත්කර යැවූ රජතුමා කවුරුන්ද?
(1) පළමුවන බුවනෙකබාහු ය. (2) දෙවන බුවනෙකබාහු ය.
(3) හතරවන බුවනෙකබාහු ය. (4) පස්වන බුවනෙකබාහු ය.

(14) පාලි භාෂාවෙන් ලියා තිබූ පන්සිය පනස් ජාතක පොත සිංහලට පරිවර්තනය කරන ලද්දේ,
(1) දඹදෙණි රාජධානි සමයේ ය (2) යාපහුව රාජධානි සමයේ ය
(3) කුරුණෑගල රාජධානි සමයේ ය (4) කෝට්ටේ රාජධානි සමයේ ය

(15) යාපනය පාලනය කළ ආර්ය චක්‍රවර්ති පරපුරේ ආරම්භක පාලකයා ලෙස සැලකෙන්නේ,
(1) විජය කුලංගෛ ය. (2) පරරාජසේකරම් ය.
(3) සංකිලි ය. (4) පුවිරාජපණ්ඩාරම් ය.

(16) ග්‍රීක ශිෂ්ටාචාරය ආරම්භ වීමට පෙර එහි පැවති පැරණි ශිෂ්ටාචාරය හැඳින්වූයේ කුමන නමින්ද?
(1) මොහෙන්ජදාරෝ හරප්පා (2) මෙසපොතේමියානු
(3) දෙගම්මැදි (4) මිනෝවන්

(17) පහත සඳහන් ක්‍රීඩා අතුරින් ග්‍රීක ශිෂ්ටාචාර වැසියන්ට ආවේණික වූ ක්‍රීඩාවක් නොවන්නේ කුමක්ද?
(1) මල්ලව පොර (2) බර ඉසිලීම
(3) රථ ධාවන තරඟ (4) කවපෙත්ත විසිකිරීම

(18) පළමුවන රෝම අධිරාජයා ලෙස සැලකෙන්නේ,
(1) ඔගස්ටස් සීසර් ය. (2) ජුලියස් සීසර් ය.
(3) මහා ඇලෙක්සැන්ඩර් ය. (4) යුරිපිඩිස් ය.

(19) ''ඊනිඩ් නම් වූ සුප්‍රසිද්ධ රෝම පද්‍ය ග්‍රන්ථය රචනා කරන ලද කතුවරයා කවුරුන්ද?
(1) හෝමර් (2) වර්ජිල් (3) රොමියුලස් (4) පෙරික්ලීස්

(20) මෙරට මූලාශ්‍ර වල සඳහන් වන පරිදි රුවන්වැලිසෑයට පිදීම සඳහා රෝමයෙන් පබළු ගෙන්වා ගත් රජතුමා මින් කවුරුන්ද?
(1) දුටුගැමුණු (2) මහසෙන් (3) ධාතුසේන (4) භාතිකාභය
(ලකුණු 20x2=40)

II කොටස

* පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.

* අනෙකුත් ප්‍රශ්න අතුරින් කැමති ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන පහකි.

---

(01) A හා B යටතේ දැක්වෙන පින්තූර සම්බන්ධව අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු අංක අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.


A



(i) A පින්තූරයෙන් දැක්වෙන නිර්මාණය හඳුන්වන්නේ කුමන නමකින්ද?

(ii) එය භාවිතා කර ඇත්තේ කුමන කාර්යයක් සඳහා ද?

B



(iii) B පින්තූරයේ දැක්වෙන මූර්තිය නම් කරන්න.

(iv) එය කුමන ශිෂ්ටාචාරයට අයත් වේද?

⋆ පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(v) මානවම්ම කුමරු රාජ්‍යත්වයට පත්වීමට පෙර අනුරාධපුරය පාලනය කළ රජතුමා කවුද?

(vi) මාන කුමාරයාට රාජ්‍යත්වයට පත් වීමට සහාය දුන් දකුණු ඉන්දීය පාලකයාගේ නම කුමක්ද?

(vii) මාන කුමාරයාට සහාය දුන් දකුණු ඉන්දීය රාජ්‍යය නම් කරන්න.

(viii) ලංකාව ආක්‍රමණය කර, පස්වන මිහිඳු රජතුමා සිරකරුවකු ලෙස චෝල දේශයට රැගෙන ගිය අධිරාජයාගේ නම කුමක්ද? (ලකුණු 2x8=16)

(02) (i) උම්මග්ග ජාතකයේ හා සෙල්ලිපිවල හේන් හැඳින්වීමට භාවිතා කර ඇති වචන දෙක පිළිවෙලින් ලියා දක්වන්න. (ල. 2)

(ii) හේන් බස් වහරේ එන පහත වචනවල අදහස කෙටියෙන් සඳහන් කරන්න.

A. නවදැලි හේන B. හැලිකටා (ල. 4)

(iii) අපේ පැරණි ගොවියෝ අස්වනු නෙලාගන්නා තෙක් ගොයම ආරක්ෂා කර ගැනීමට භාවිතා කළ සාම්ප්‍රදායික ක්‍රම දෙකක් විස්තර කරන්න. (ල. 5)

(03) (i) අනුරාධපුර රාජ්‍ය සමයේදී දේශපාලන ගැටුම් ඇතිවූ රජපෙළපත් දෙකක් නම් කරන්න. (ල. 2)

(ii) රාජ්‍ය පාලන කටයුතු වලදී රජුට සහාය වූ නිළධාරින් සිව් දෙනෙක් නම් කරන්න. (ල. 4)

(iii) අනුරාධපුර යුගයේ රජවරු ආර්ථික හා සමාජ සුභ සාධනය සඳහා කරන ලද කාර්යයන් දෙකක් විස්තර කරන්න. (ල. 5)

(04) (i) මහා විජයබාහු රජතුමා පිළිබඳ තොරතුරු හැදෑරීමට වැදගත් වන මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ල. 2)

(ii) මහා විජයබාහු රජතුමාගේ චරිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ දෙකක් ලියන්න. (ල. 4)

(iii) මහා පරාක්‍රමබාහු රජතුමාගේ ආර්ථික සංවර්ධන කටයුතු හා ශාසනික කටයුතු එක බැගින් විස්තර කරන්න. (ල. 5)

(05) (i) අපේ සංස්කෘතික උරුමයන් අතුරින් අස්පෘශ්‍ය උරුමයන් දෙකක් ලියා දක්වන්න. (ල.2)

(ii) සීගිරිය ලෝක උරුමයක් වීමට බලපාන ලද හේතු දෙකක් සඳහන් කරන්න. (ල.4)

(iii) සංස්කෘතික උරුම අප විසින් ආරක්ෂා කරගත යුත්තේ ඇයිදැයි කෙටියෙන් විස්තර කරන්න. (ල.5)

(06) (i) පොළොන්නරුව රාජධානිය බිඳ වැටීමෙන් පසුව පහත සඳහන් ස්ථානවල බලකොටු පිහිටුවාගත් නායකයින් A හා B අනුපිළිවෙලින් ලියා දක්වන්න.

A - මිනිපේ - ගංදෙණිය B - යාපහුව කඳු මුදුන (ල.2)

(ii) කෝට්ටේ හයවන පරාක්‍රමබාහු රජ සමයේ වැදගත් සිදුවීම් දෙකක් සඳහන් කරන්න.(ල.4)

(iii) දඹදෙණියේ දෙවන පරාක්‍රමබාහු රජතුමා මුහුණ දුන් අභියෝග 2ක් සහ එතුමාගේ සේවාවන් 03 ක් සඳහන් කරන්න. (ල.5)

(07) (i) ග්‍රීසියේ ජීවත් වූ අග්‍ර ගණයේ ග්‍රීක දාර්ශනිකයින් දෙදෙනෙක් නම් කරන්න. (ල.2)

(ii) රෝම ශිෂ්ටාචරයෙන් ලොවට උරුම වූ දායාද දෙකක් ලියා දක්වන්න (ල.4)

(iii) ග්‍රීක ශිෂ්ටාචාරයේ ජන ජීවිතය පැවති ආකාරය ඉතා කෙටියෙන් විස්තර කරන්න. (ල.5)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මේල් මාகாணக் கல்வித் திணைக்களம் Department of Education - Western Province

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

පිළිතුරු පත්‍රය
**Marking Scheme**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II |

## ඉතිහාසය I

| | | | | |
|---|---|---|---|---|
| (1) 2 | (2) 1 | (3) 3 | (4) 1 | (5) 4 |
| (6) 3 | (7) 4 | (8) 1 | (9) 4 | (10) 1 |
| (11) 2 | (12) 3 | (13) 1 | (14) 3 | (15) 1 |
| (16) 4 | (17) 3 | (18) 1 | (19) 2 | (20) 4 |

ලකුණු $2 \times 20 = 40$

## ඉතිහාසය II

(01) (i) වී බිස්ස
(ii) වී ආරක්ෂා සහිතව තැම්පත් කිරීමට
(iii) කවපෙත්ත විසිකරන්නා
(iv) ග්‍රීක
(v) හත්තදාඨ රජු
(vi) දෙවන නරසිංහ වර්මන්
(vii) පල්ලව
(viii) පළමුවන රාජේන්ද්‍ර

(02) (i) සේන්, පිටබිම්
(ii) A - අළුතින් ගිනිතබා සකස් කළ හේන
B - හිසට වළඳක් තබා සාදාගන්නා ලද පඹයා
(iii) නියරවල සහ කුඹුරේ පොල්පිති සිටුවීම / තෙල් පොගවන ලද පහන් තිර පත්තු කිරීම ආදී අදාල කරුණු දෙකක් විස්තර කිරීම.

(03) (i) ලම්බකර්ණ, මෞර්ය (මෝරිය)
(ii) යුවරජු, සේනාපති, භාණ්ඩාගාරික, මහාලේඛක, අග අදෙක, අති අදෙක වැනි නිළධාරීන් 04 ක් ලියා දැක්වීම.
(iii) වැව් හා වාරිමාර්ග තැනවීම, ඒවා නඩත්තු කිරීම
බුද්ධදාස රජු, පළමුවන උපතිස්ස රජු, පළමුවන උදය රජු, පස්වන කස්සප රජු, ජනතාව වෙනුවෙන් ඉටුකළ වෛද්‍ය සේවා විස්තර කිරීම.

(04) (i) මහා වංශය , පනාකඩුව තඹ සන්නස, අඩගමුව ශිලා ලිපිය. මින් 02ක් ලිවීම.

(ii) අවංකකම, කෘතගුණ සැළකීමේ ගුණය, නොපසුබස්නා උත්සාහය, මව් බිමට ආදරය කිරීම (දේශප්‍රේමී ගුණය).... ආදී ආදර්ශ 02ක් ලිවීම.

(iii) දදුරු ඔයේ ජලය කෘෂි කාර්මික කටයුතුවලට යොදා ගැනීම සඳහා අමුණු බැඳ ජලය හැරවීම.
කුඩා වැව් විශාල කිරීම, වැව් අමුණු ප්‍රතිසංස්කරණය.
පස්දුන් කෝරළයේ වගුරු බිම්වල ජලය බස්සවා එම බිම් සංවර්ධනය කිරීම.
පරාක්‍රම සමුද්‍රය ඉදි කිරීම...... ආදී කරුණු එක බැගින් විස්තර කිරීම.

(05) (i) ජනවහර, රංග කලාව, ජනකවි , ඇදහිලි විශ්වාස, සාම්ප්‍රදායික කලා ශිල්ප ආදී ඒවායින් 02ක් ලිවීම.

(ii)
- ⋆ සීගිරියේ උද්‍යාන නිර්මාණයේ විශිෂ්ටත්වය.
- ⋆ සිංහ ගිරිය, සීගිරි චිත්‍රවල කලාත්මක භාවය.
- ⋆ සීගිරි චිත්‍රවල, කල්පැවැත්ම හා තාක්ෂණය.
- ⋆ සීගිරියේ ජලතාක්ෂණය, ජලමල් , පොකුණු.

(iii) අනාගත පරපුර වෙනුවෙන් ආරක්ෂා කිරීම, අපේ අභිමානය, හා අනන්‍යතාවය ලෝකයට පෙන්වීම, සංචාරක කර්මාන්තයේ දියුණුවට ආදී අදාල කරුණු පිළිබඳ විස්තරයක් ලිවීම.

(06) (i) A - සංඛ සෙනවි
B - සුභ සෙනවි

(ii)
- ⋆ හයවන පරාක්‍රමබාහු රජු යටතේ නැවතත් රට එක්සත් වීම
- ⋆ අධ්‍යාපනයේ හා සාහිත්‍යයේ දියුණුව (පිරිවෙන්, සාහිත්‍ය පොත්)
- ⋆ උගත් පඬිවරු රැසක් බිහිවීම (මින් කරුණු දෙකක් ලිවීම)

(iii) අභියෝග :
- ⋆ කාලිංග මාඝ පළවා හැරීම
- ⋆ චන්ද්‍රභානු රජුගේ ආක්‍රමණ දෙකකට මුහුණ දී ජය ගැනීම

සේවාවන් :
- ⋆ දඹදෙනියේ දළදා මාළිගාවක් ඉදිකර දළදාව තැම්පත් කිරීම
- ⋆ දේව පතිරාජ ඇමතිවරයා ලවා රටේ සංවර්ධන කටයුතු සිදු කරවීම
- ⋆ ශ්‍රී පාදස්ථානයට යන මාර්ගය වැඩි දියුණු කිරීම
- ⋆ උයන් තැනවීම, පාලම් සෑදවීම, පොල් වැනි බෝග වගා කරවීම, මින් කරුණු 05 ක් ලිවීම

(07) (i) සොක්‍රටීස්, ප්ලේටෝ, ඇරිස්ටෝටල්, හිපොක්‍රටීස්, හෙරඩෝටස්.... ආදී දාර්ශනිකයින් 02 ක් නම් කිරීම

(ii) ⋆ කිතුණු දහම ⋆ රෝම නීතිය ⋆ ලතින් භාෂාව ⋆ රෝම ගෘහ නිර්මාණ ශිල්පය
මින් දෙකක් ලිවීම

(iii) පවුලේ ප්‍රධානියා පියාය. කාන්තාවට ගෞරවනීය ස්ථානයක් හිමිවී තිබීම. මව පූජනීයත්වයෙන් සැලකීම, ප්‍රභූන්, සාමාන්‍ය ජනතාව, වහලුන් වශයෙන් සමාජය කොටස් තුනකින් සමන්විත වීම. ආදී කරුණු කෙටියෙන් විස්තර කිරීම.